සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර ඇගයීම
Second Term Evaluation - 2018

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | 1 |
|---|---|---|---|---|---|---|---|

**සැලකිය යුතුයි.**

i සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ii අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.

**iii ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

iv එම පිළිතුරු පත්‍රයේ පිටු පස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

---

1. සිදුහත් කුමරුගේ ශිෂ්‍ය ජීවිතයේ සුවිශේෂී ලක්ෂණයක් වූයේ,
   1. සිය වයසට ගැළපෙන දේ නොකිරීමයි.
   2. තමාට හෝ තම දෙමාපියන්ට අගෞරව වන කිසිවක් නොකිරීමයි.
   3. තමාට වරප්‍රසාද ලැබෙන සේ ක්‍රියාකිරීමයි.
   4. සක්විති රජකම අපේක්ෂාවෙන් කටයුතු කිරීමයි.

2. බුද්ධ ශාසනයේ අඛණ්ඩ පැවැත්ම උදෙසා ගිහි ජනතාව විසින් ඉටු කළයුතු වැදගත්ම කාර්යය වන්නේ,
   1. නිතර සිව්පසයෙන් භික්ෂූන්ට සංග්‍රහ කිරීමයි.
   2. වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීමයි.
   3. සැමදා බෝධිපූජා පැවැත්වීමයි.
   4. පැවිදි කිරීම සඳහා කුලදරුවන් පූජා කිරීමයි.

3. පුද්ගලයා තෙරුවන් සරණ යා යුත්තේ,
   1. ශ්‍රද්ධාව මුල්කර ගෙන
   2. ප්‍රඥාව මුල්කර ගෙන
   3. ශ්‍රද්ධාව හා ප්‍රඥාව මුල්කර ගෙන
   4. දානය හා ශීලය මුල්කර ගෙන

4. තමා විසින්ම පිළිපැද ඇස් පනාපිට මෙලොවදීම ප්‍රතිඵල දැක ගත හැකි බැවින් ධම්ම රත්නය,
   1. සන්දිට්ඨික ය.
   2. අකාලික ය.
   3. ඒහිපස්සික ය.
   4. ඕපනයික ය.

5. ත්‍රිවිධ රත්නයේ ගුණ සූවිසි වැදෑරුම්ය. ඒ අනුව ධර්ම රත්නයේ ගුණ,
   1. 03 කි.
   2. 06 කි.
   3. 09 කි.
   4. 12 කි.

6. සිතේ නොසන්සුන්කම හා කළ නොකළ දේ පිළිබඳ පසුතැවීම හැඳින්වීම සඳහා ධර්මයේ දක්වා ඇත්තේ,
   1. කාමච්ඡන්දයයි.
   2. උද්ධච්ච කුක්කුච්චයයි.
   3. ථිනමිද්ධයයි.
   4. විචිකිච්ඡාවයි.

7. සත්වයාගේ භෞතික ශරීරය ගොඩනැගී ඇත්තේ සතර මහා භූත වලිනි. එම භූත ධර්මවල පඨවි ධාතු යනු
   1. වැගිරෙන ස්වභාවයයි.
   2. උෂ්ණ, ශීතල ස්වභාවයයි.
   3. තද ස්වභාවයයි.
   4. සෙලවෙන ස්වභාවයයි.

8. විපස්සනා භාවනාවට යෙදෙන පර්යාය නාමයක් වන්නේ,
   1. සමාධි භාවනාවයි.
   2. චිත්ත භාවනාවයි.
   3. ප්‍රඥා භාවනාවයි.
   4. ධ්‍යාන භාවනාවයි.

9. උඩුනුවර නියම කන්දේ පිරිවෙනක් පිහිටුවා භික්ෂු අධ්‍යාපනය නගාසිටුවීමට උරදෙන ලද්දේ,
   1. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා ය.
   2. සියම් දේශයෙන් වැඩම කළ උපාලි තෙරුන් ය.
   3. වැලිවිට අසරණ සරණ සිරි සරණංකර මාහිමියන් ය.
   4. හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි ය.

10. වැලිවිට සිරි සරණංකර මාහිමියන් ඇතුළු හය නමක් උපසම්පදා කිරීම සඳහා භික්ෂූන් වහන්සේලා වැඩම කළේ,
   1. තායිලන්තයෙන් ය.
   2. මියන්මාරයෙන් ය.
   3. භාරත දේශයෙන් ය.
   4. චීනයෙන් ය.

11. උත්සාහවන්ත බව, නොපසුබස්නා වීර්යය, නොමැලිව කාර්යක්ෂමව ක්‍රියාකිරීම, කාය ශක්තිය හා චිත්ත ශක්තිය නොමඳව යොදවා වැඩ කිරීම ධර්මයේ දක්වා ඇත්තේ,
   1. සතිමතෝ ලෙසිනි.
   2. සුචිකම්ම ලෙසිනි.
   3. ධම්මජීවී ලෙසිනි.
   4. උට්ඨානවතෝ ලෙසිනි.

12. පුද්ගල චරිත සංවර්ධනයට පාදක වන්නේ සීලයයි. එම සීලය අංගසම්පූර්ණ වීම සඳහා ක්‍රියාවට නැංවිය යුතු අංග දෙක වන්නේ,
   1. විරමණය හා විරිත්ය.
   2. විරමණය හා සමාදානයයි.
   3. සමාදානය හා චාරිත්‍රයයි.
   4. විරමණය හා වාරිත්‍රයයි.

13. "ඕනෑම පිරිසක් මැදට නිර්භයව එළඹීමට හැකියාව ලැබීම",
   1. භාවනා කිරීමෙන් ලැබෙන ආනිසංසයකි.
   2. දන්දීමෙන් ලැබෙන ආනිසංසයකි.
   3. මෛත්‍රී කිරීමෙන් ලැබෙන ආනිසංසයකි.
   4. සිල් රැකීමෙන් ලැබෙන ආනිසංසයකි.

14. දුශ්ශීලව, නොසන්සුන් සිත් ඇතිව අවුරුදු සීයක් ජීවත් වීමට වඩා සිල්වත්ව, සන්සුන් සිත් ඇතිව එක දවසක් ජීවත් වීම ශ්‍රේෂ්ඨ බව කියැවෙන ධම්මපද ගාථාවේ මුල් පද පේළිය වන්නේ,
   1. "යො චේ වස්සසතං ජීවේ" යන්නය.
   2. "ආරභථ නික්ඛමථ" යන්නය.
   3. "අචරිත්වා බ්‍රහ්මචරියං" යන්නය.
   4. "උට්ඨානවතෝ සතිමතෝ" යන්නය.

15. සිගාලෝවාද සූත්‍රයේදී සමස්ත සමාජය ම ප්‍රභේද සයකට බෙදා ඔවුනොවුන් අතර යුතුකම් 61 ක් ඉටුවිය යුතු බව අවධාරණය කර ඇත. ඔවුන් අතරින් එක් සමාජ සංස්ථාවක් අනෙක් සමාජයට යුතුකම් හයක් ඉටු කළ යුතු බව ද උගන්වා ඇත. එම සමාජ ස්තරය වන්නේ,
   1. මව්පියන් ය.
   2. ගුරුවරුන් ය.
   3. පැවිදි උතුමන් ය.
   4. මිත්‍රයින් ය.

16. "ස්වාමියාට පළමුව පිබිදීමේ" වගකීම පවරා ඇත්තේ,
   1. භාර්යාවට ය.
   2. සේවකයාට ය.
   3. ශිෂ්‍යයාට ය.
   4. දරුවන්ට ය.

17. නිතර ආමිසයෙන් සංග්‍රහ කරන ගිහියාට පැවිදි උතුමන් විසින්,
   1. දානයෙන් සංග්‍රහ කළ යුතුය.
   2. නිවාස සාදා දීමෙන් සංග්‍රහ කළ යුතුය.
   3. ධර්ම දානයෙන් සංග්‍රහ කළ යුතුය.
   4. සීලයෙන් සංග්‍රහ කළ යුතුය.

18. බුදුදහම තුළ උත්තම පෞරුෂ ඇත්තන් ලෙස සඳහන් කරනු ලබන්නේ,
   1. බුදුරජාණන් වහන්සේය.
   2. රහතන් වහන්සේය.
   3. සෝවාන් තත්වයට පත් උපාසකයන්ය.
   4. බුදු, පසේබුදු, මහරහත් උතුමන් ය.

19. සසර කතරේ කෙලෙස් බරිත පුද්ගලයා රාගයෙන් රාගයට ම, ද්වේශයෙන් ද්වේශයට ම, මෝහයෙන් මෝහයට ම ගමන් කරයි. එවැනි මිනිසුන් සහිත සමාජයේ සුසිරිත් වඩන තැනැත්තෙකුව ජීවත් විය යුතු බව බෞද්ධ ඉගැන්වීමයි. ඒ බව කියැවෙන දහම් පදය වන්නේ,
   1. අනුසෝතගාමී යන්නයි.
   2. පටිසෝතගාමී යන්නයි.
   3. මහිච්ඡතාවය යන්නයි.
   4. අයෝනිසෝ මනසිකාරය යන්නයි.

20. යම් ආපදාපන්න අවස්ථාවකදී විවිධ ආගම්වලට හා නොයෙක් ජාතීන්වලට ඇතුළත් පවුල්වල බොහෝ ජනයා විවිධ විපත්වලට මුහුණ දෙති. එවැනි මොහොතක ජාති කුලමල අමතක කොට අන්‍යෝන්‍ය උපකාරීත්වයෙන් ක්‍රියා කර ජීවිත ජය ගත යුතුය. එම තත්වය පැහැදිලි කිරීම සඳහා ධර්මයේ භාවිත වන ඉගැන්වීම වන්නේ,
   1. සහකම්පනය යන්නයි .
   2. "සියල්ලෝ සුව ඇත්තෝ වෙත්වා" යන්න යි.
   3. "සහජීවනය" යන්න යි.
   4. "සමගිය බලය වේ" යන්නයි.

21. "භවත් ගෞතමයන් වහන්ස, මේ මිනිස් ලෝකයේ ජීවත්වන හැමදෙනාම එක සමාන නැහැ. සමහරුන්ට ආයුෂ අඩුයි. සමහරුන්ට වැඩියි. සමහරුන්ට ලෙඩ දුක් අඩුයි. සමහරුන්ට වැඩියි............ මෙසේ වීමට හේතුව කුමක්ද ?" යනුවෙන් ප්‍රකාශ කළේ,
   1. අභයරාජ කුමාරයා ය.
   2. සුභ මානවකයා ය.
   3. උපාලි ගෘහපතියා ය.
   4. සෝණදණ්ඩ බමුණා ය.

22. මිථ්‍යා දෘෂ්ටිය හෙවත් වැරදි දැකීම,
   1. මානසික දුසිරිතයකි.
   2. වාචසික දුසිරිතයකි.
   3. කායික දුසිරිතයකි.
   4. මානසික සුසිරිතයකි.

23. ආර්ය අෂ්ටාංගික මාර්ගය අයත් වන්නේ,
   1. දුක්ඛ ආර්ය සත්‍යයට ය
   2. දුක්ඛ සමුදය ආර්ය සත්‍යයට ය
   3. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යයට ය
   4. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යයට ය

24. සසර දුකින් නිදහස්ව නිවන් දක්නා ජාති දක්වා කිසියම් භවයකදී විපාක ලබාදීමට සමත් කර්මය,
   1. දිට්ඨධම්මවේදනීය කර්මයයි.
   2. අපරාපරියවේදනීය කර්මයයි.
   3. උපපජ්ජවේදනීය කර්මයයි.
   4. අහෝසි කර්මයයි.

25. ස්ථානෝචිත ප්‍රඥාවෙන් හා උත්සාහයෙන් කටයුතු කිරීමේදී තමාට මුහුණ දීමට සිදුවන අකුසල කර්ම විපාක ද මගහරවා ගෙන වාසනාව උදාකර ගත හැකි බව බුදු දහම පිළිගනියි. එම ඉගැන්වීම,
   1. ගති සම්පත්තියයි.
   2. කාල සම්පත්තියයි.
   3. ප්‍රයෝග සම්පත්තියයි.
   4. උපධි සම්පත්තියයි.

26. පුද්ගල ජීවිතයේ ළදරු, තරුණ, වැඩිහිටි හා මහලු වශයෙන් පියවර කීපයක් දක්නට ලැබේ. එම විශ්ව ධර්මය,
   1. අනාත්ම ලක්ෂණයයි.
   2. දුක්ඛ ලක්ෂණයයි.
   3. සංස්කාර ලක්ෂණයයි.
   4. අනිත්‍ය ලක්ෂණයයි.

27. රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණාදිය තණ්හාවෙන් තදින් අල්ලා ගැනීම නිසා ඇතිවන දුක,
   1. පංච උපාදානස්කන්ධ දුකයි.
   2. සංඛාර දුකයි.
   3. විපරිණාම දුකයි.
   4. ව්‍යාධි දුකයි.

28. "අනිච්ඡාවත සංඛාරා - උප්පාද වයධම්මිනෝ" යන ගාථාව ඇතුළත් මූලාශ්‍රය,
   1. අරුණවතී සූත්‍රයයි.
   2. පරාභව සූත්‍රයයි.
   3. මහා පරිනිබ්බාන සූත්‍රයයි.
   4. කරණීයමෙත්ත සූත්‍රයයි.

29. සැරියුත් මුගලන් මහරහතන් වහන්සේලාගේ ගිහි කල නම් පිළිවෙළින් අන්තර්ගත වරණය වන්නේ,
   1. කෝලිත හා සංජය ය.
   2. උපතිස්ස හා කෝලිත ය.
   3. සංජය හා උපතිස්ස ය.
   4. කෝලිත හා සිගාල ය.

30. අස්සජි මහරහතන් වහන්සේ උපතිස්ස පරිබ්‍රාජකයාට දේශනා කළේ,
   1. හේතුඵල දහමයි.
   2. ත්‍රිලක්ෂණයයි.
   3. චතුරාර්ය සත්‍යයයි.
   4. පුනර්භවයයි.

31. අනුලෝම පටිච්ච සමුප්පාදයෙන් පැහැදිලි හැක්කේ,
    1. සමාජ දුක නැතිවන ආකාරයයි.
    2. සසර දුක සමනය වන ආකාරයයි.
    3. සමාජ ගැටලු ඇතිවන ආකාරයයි.
    4. නිවනට ළඟා වන ආකාරයයි.

32. බුදුරජාණන් වහන්සේ මංගල ධර්ම දේශනාවේදී දේශනා කොට වදාළේ,
    1. හේතුඵල දහමයි.
    2. ත්‍රිලක්ෂණ යයි.
    3. චතු අප්පමඤ්ඤාවයි.
    4. චතුරාර්ය සත්‍යයයි.

33. ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුළ සමාධි ශික්ෂාවට අයත් අංගයක් වන්නේ,
    1. සම්මා වායාමයයි.
    2. සම්මා කම්මන්තයයි.
    3. සම්මා දිට්ඨියයි.
    4. සම්මා ආජීවයයි.

34. අත්තකිලමතානු යෝගය යනු,
    1. අසීමිත ලෙස ඉඳුරන් පිනවමින් සත්‍ය සෙවීමේ පිළිවෙතයි.
    2. අසීමිත ලෙස ඉඳුරන් තවමින් සත්‍ය සෙවීමේ පිළිවෙතයි.
    3. නිවන් දැකීමේ සැබෑ පිළිවෙතයි.
    4. අදෘශ්‍යමාන දෙවියන් විශ්වාස කිරීමේ පිළිවෙතයි.

35. බුදුරජාණන් වහන්සේ තුරිත අතුරිත චාරිකාවේ යෙදෙමින් ලෝක සත්වයාට ධර්ම දේශනා කළේ,
    1. වසර 45 කි.
    2. වසර 49 කි.
    3. වසර 80 කි.
    4. වසර 120 කි.

36. බුදු දහමේ ඇතිවීම් හා නැතිවීම් හේතුවෙන් හටගන්නා දුක් හඳුන්වා ඇත්තේ,
    1. සංඛාර දුක්ඛතා නමිනි.
    2. විපරිණාම දුක්ඛතා නමිනි.
    3. දුක්ඛ දුක්ඛතා නමිනි.
    4. දුක්ඛ සත්‍යය නමිනි.

37. ගෞතම බෝසතාණන් වහන්සේ බුද්ධත්වය ලැබීමට පෙර දින දිවා කාලයේ වාසය කළේ,
    1. අනෝමා ගංතෙර ය.
    2. සේනානි ගමේ ය.
    3. භද්‍ර වනයේ ය.
    4. බෝධි පර්යංකයේ ය.

38. බුදුරජාණන් වහන්සේ පරිසරයට හිතමිතුරුව කටයුතු කළා සේම පරිසරයද උන්වහන්සේට මිතුරුව කටයුතු කළ අවස්ථාවකට නිදසුන් වන්නේ,
    1. රාජ භෝජන ලැබීමයි.
    2. දෙව් බඹුන්ගේ ප්‍රශංසාව ලැබීමයි.
    3. ආරාම පූජාවන් ලැබීමයි.
    4. මුචලින්ද නාග රාජයාගේ ආරක්ෂාව ලැබීමයි.

39. බුදුරජාණන් වහන්සේ සාමඤ්ඤඵල සූත්‍රය දේශනා කළේ,
    1. ජීවක අඹ වනයේදී ය.
    2. මහීගංගා තීරයේදී ය.
    3. ඉසිපතන මිගදායේදී ය.
    4. විශාලා මහනුවරදී ය.

40. බුදුරජාණන් වහන්සේ ළමයින් පිරිසකගේ හිරිහැරයට ලක්ව සිටි ගැරඬියෙකු ඉන් ගලවා ගැනීමත්, උදේන රජුගේ ඇත්හලේ සිට පසුව නොසලකා හැරීමට ලක්ව සිටි භද්‍රවතිකා ඇතින්නට පුරුදු උවටැන් ලබා දීමට සැලැස්වීමත් තුළින් ප්‍රකට වන්නේ උන්වහන්සේගේ,
    1. තාදී ගුණයයි.
    2. පද්මාකාර ජීවිතයයි.
    3. උපේක්ඛා ගුණයයි.
    4. ජීව පරිසරයේ ආරක්ෂාව තහවුරු කිරීමේ ආදර්ශයයි.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර ඇගයීම - 2018
Second Term Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 10 | |
| විෂයය / பாடம் / Subject | බුද්ධ ධර්මය | |
| පත්‍රය / வினாத்தாள் / Paper | II | |
| පැය / மணித்தியாலம் / Hours | 02 | |

- පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගත් අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

1.

i. සිදුහත් බෝසතාණන් වහන්සේ මනුලොව උපත ලද අවස්ථාවේ සිදු වූ ආශ්චර්යමය සිද්ධි දෙකක් ලියන්න.

ii. භික්ෂූන් වහන්සේ විසින් ආරක්ෂා කරනු ලබන මනා වූ පිළිවෙත් අතුරෙන් දෙකක් ලියන්න.

iii. "භාවේති කුසල ධම්මේ ආසේවති වඩ්ඪේති ඒතායතාති භාවනා" යන පාලි පාඨයේ අර්ථය ලියා දක්වන්න.

iv. සිරි සරණංකර සංඝරාජයාණන් වහන්සේ විසින් රචිත ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

v. "දුන්නෙන් විදින ලද ඊතලය වේගයෙන් ගොස් වනයේ වැටී දිරාපත් වන්නාක් මෙන්" යන උපමාව අන්තර්ගත ධම්මපද ගාථාව ලියන්න.

vi. තම දෙමව්පියන්ගේත් මහා බ්‍රහ්මයාගේත් සමානව පවත්නා ගුණ ධර්ම ලියා දක්වන්න.

vii. "අභිධ්‍යාව" යන්නෙහි අර්ථය දක්වන්න.

viii. වචනයෙන් සිදුවන අකුසල කර්ම දෙකක් ලියන්න.

ix. පංචස්කන්ධයේ එන රූප හා සංඥා හැඳින්වීම සඳහා ධර්මයේ භාවිත වන උපමා දෙක ලියන්න.

x. "ඉමස්මිං අසති ඉදං න හෝති - ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣන්ති" යන පාලි පාඨයේ අර්ථය ලියන්න.

( ලකුණු 2 x10=20)

2.

i. ගෞතම සිද්ධාර්ථ බෝධිසත්වයන් වහන්සේ මුහුණ දුන් අභියෝග දෙකක් ලියන්න. (ලකුණු 2)

ii. ඉහත නම් කරන ලද එක් අභියෝගයක් විස්තර කරන්න. (ලකුණු 3)

iii. සිදුහත් බෝසත් චරිතයෙන් ආදර්ශ ගෙන ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 5)

3.

i. සීලය අංගසම්පූර්ණ වීම සඳහා ක්‍රියාවට නැංවිය යුතු අංග දෙක නම් කරන්න. (ලකුණු 2)

ii. සීලය අංගසම්පූර්ණත්වය උදෙසා කායික ක්‍රියා සිදු කළ යුතු ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 3)

iii. සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස පැහැදිලි කරන්න. (ලකුණු 5)

4.

i. නිවැරදි දිසා නමස්කාරය පැහැදිළි කරමින් බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ සූත්‍රය කුමක්ද? (ලකුණු 2)

ii. එම සූත්‍රයේදී දෙමාපියන් නැගෙනහිර දිශාවට උපමා කර ඇත්තේ කුමක් නිසා දැයි පෙන්වා දෙන්න. (ලකුණු 3)

iii. යුතුකම් මනාව ඉටුවීමෙන් පුද්ගල දියුණුව මෙන්ම සමාජ දියුණුව ඇති වන ආකාරය කුමන හෝ සමාජ කණ්ඩායමක් නිදසුන් ලෙස ගෙන පැහැදිලි කරන්න. (ලකුණු 5)

5.

i. "දිට්ඨධම්මවේදනීය කර්ම" යන්නෙහි අර්ථය දක්වන්න. (ලකුණු 2)

ii. අකුසල කර්ම කිරීමට පුද්ගලයා පොළඹවන ප්‍රධාන මානසික මූලයන් අර්ථ සහිතව ලියා දක්වන්න. (ලකුණු 3)

iii. දස අකුසල ක්‍රියා හඳුන්වා දෙන්න. (ලකුණු 5)

6.

i. බුද්ධ කාලීන භාරතයෙහි ප්‍රධාන වශයෙන් පිළිගත් විමුක්තිකාමී පටිපදාවන් දෙක නම් කරන්න. (ලකුණු 2)

ii. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ එන සීල ශික්ෂාවට අයත් අංග හඳුන්වා දෙන්න. (ලකුණු 3)

iii. පුද්ගලයා මුහුණ දෙන ගැටලු විසඳා ගැනීමට චතුරාර්ය සත්‍යය උපයෝගී කර ගත හැකි ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 5)

7. පහත සඳහන් මාතෘකා දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

i. ධම්ම පදය (ලකුණු 5)

ii. සහජීවනය උගන්වන බෞද්ධ ඉගැන්වීම් (ලකුණු 5)

iii. ත්‍රිලක්ෂණ ධර්මය (ලකුණු 5)

iv. දුටුගැමුණු රජතුමා (ලකුණු 5)